"කතුන්ට දැරියන්ට කොඩිවිනයක් වූ යකැදුරෝ" යනු සිරස්තලයෙන් ඉරිදා ලංකාදීප (08/08) පුවත්පතේ සහ "කළුකුමාර දිෂ්ටිය ශරීරයෙන් අරින්නැයි නැන්දයි ලේලියි කෙලෙසූ යකාගේ කට්ටඩියා" යනු සිරස්තලයෙන් මව්බිම (08/08) පුවත්පතේ පළවී තිබූ පුවත් දෙකකි. මෙම පුවත් දෙකම එක් සිදුවීමක් පාදක කොට ගෙන ඉදිරිපත්ව තිබූ අතර, මෙම පුවත් වාර්තා දෙකේම "සුරූපී", "රුවැත්තියකි", "ලාබාල පෙනුමක් ඇති", "සුරූපී" යන විශේෂණ භාවිතා කරමින් වින්දිතයන්ව හඳුන්වා දී තිබූ අයුරු නිරීක්ෂණය කළ හැකි විණි.

ලිංගික අතවර සිදුවීමක් වාර්තා කිරීමේදී, මෙසේ අදාළ වින්දිත කාන්තාවන්ගේ බාහිර ස්වරූපය මෙසේ භාවාතිෂය ලෙසින් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේදැයි පාඨකයින් ලෙසින් අප ඇසිය යුතුයි. මෙවැනි ලිංගික අතවර සිදුවීමක් වාර්තා කිරීමේදී කාන්තා බාහිර ස්වරූපය දිගින් දිගටම විස්තර කරන්නේ පාඨක ආකර්ෂණය එම පුවතට දිනා ගැනීම සඳහාද? නමුත්, ඒ ඔස්සේ සිදුවන්නේ කාන්තාව ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වෙමින් කොන් කිරීමකට ලක් වීම නොවේද? එසේ ගත් විට මෙය මාධ්‍ය ආචාර ධර්ම විරෝධී වාර්තාකරණයක් නොවන්නේද?

**#MediaEthicsSL #lka #sinhalanews #SundayLankadeepa #Mawbima**